# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2024

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

**මාලිගාවත්ත, කොළඹ -10**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

**වැය ශීර්ෂ අංකය : 290**

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
011-2472187
dgdfar@gmail.com

# පටුන


| | | පිටුව |
|---|---|---|
| **පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සංරාංශය** | | |
| 1.1 | හැඳින්වීම | 4 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 4-5 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 5-6 |
| 1.4 | සංවිධාන ව්‍යුහය | 6-9 |
| 1.5 | සංවිධාන සටහන | 10 |
| **පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | | |
| 2.1 | විශේෂ ජයග්‍රහණ | 11-31 |
| 2.2 | අභියෝග | 32-33 |
| 2.3 | ඉදිරි ඉලක්ක | 34-35 |
| **පරිච්ඡේදය 03 - 2024 වසරේ සමස්ථ මූල්‍යකාර්යසාධනය** | | |
| 3.1 | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 36-37 |
| 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 38-39 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 40-41 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 42 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 42 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 43 |
| 3.7 | මු. රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන | 43 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරිමේ කාර්ය සාධනය | 44 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 44 |
| **පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක** | | |
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 45-48 |
| **පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | | |
| 5.1 | හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු | 49-52 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 52-53 |
| **පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ** | | |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 54-55 |
| 6.2 | ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම | 56 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 56-63 |
| **පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව** | | 64-70 |

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයභාරයන් වනුයේ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත, 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීමත්, වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති, සම්මුතීන්ට අනුකූලව කළ යුතු සංශෝධන හා නව නියෝග හඳුන්වා දීම මගින් ධීවර කර්මාන්තය කළමනාකරණය හා නියාමනය කිරීම ය.

එසේම, ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වා දීම ද, පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද, අපනයන හා දේශීය පරිභෝජනය සඳහා වන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාළ වැඩිදියුණු කිරීම ද, ධීවර කුටුම්භයන්හි සමාජ හා ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම ද ප්‍රමුඛ කාර්යයන් අතරට ඇතුළත් වේ.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබා දීම

**මෙහෙවර**

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රීලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීම සඳහා ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන්අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම

### 1.2.1. අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරි ගැන්වීම
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීයමත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- අන්තර්ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම
- මහ මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබා දීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාළ දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍රනිකුත් කිරීම
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍රනිකුත් කිරීම
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩ බෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම
- ප්‍රාග්ධන භාණ්ඩ ලබා ගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම, නියාමනය සහඅධීක්ෂණය කිරීම

- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාළ දත්ත රැස් කිරීම
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයකට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්ස්‍ය අපනයන සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවි කිරීම
- ධීවර යාත්‍රා සහගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබා දීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම
- දිනපතා කාලගුණ වාර්තා සහඅයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා සහකාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර සහඇමතුම් සංඥා ලබා දීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් සහයාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කර දීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය සහවිශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහධීවරගම්මානවලයටිතලපහසුකම්සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහාවිකල්පආදායම්උත්පාදනව්‍යාපෘතික්‍රියාත්මකකිරීම

## 1.4. සංවිධාන ව්‍යුහය

ධීවර අමාත්‍යාංශය යටතේ පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. එම කටයුතු වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද පත් කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීමේ පහසුව සළකා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 09කට බෙදා වෙන් කර තිබේ.

එනම්,

1. කළමනාකරණ අංශය
2. සංවර්ධන අංශය
3. තත්ත්ව පාලන අංශය
4. ධීවර මෙහෙයුම් අංශය
5. විමර්ශන හා පුහුණු අංශය
6. තොරතුරු හා තාක්ෂණ අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් ඉටු වේ.

දිවයිනේ මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ කාර්යාල 15ක් පිහිටුවා තිබෙන අතර, එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙය වීම යටතේ ඉටු වේ.

දිස්ත්‍රික්ක තුළ මුහුදුබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ 149ක් පිහිටුවා ඇත. මෙම සෑම ධීවර පරීක්ෂක කොට්ඨාශයක ම ධීවර පරීක්ෂක කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරි සහ ධීවර නිලධාරි යන නිලධාරීන් විසින් මෙම ධීවර පරීක්ෂක කොට්ඨාශ තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම, ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 18ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිලධාරීන් දිවා-රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. මෙම ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන මගින් මහ මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පැය 24 පුරා ම තබා ගැනීමට කටයුතු කර ඇත. එමගින්, යාත්‍රා සඳහා කාලගුණ වාර්තා හා හදිසි පූර්ව අනතුරු ඇඟවීම් ද දෛනිකව ලබාදෙන අතර, යාත්‍රා හිමියන්ගේ පණිවුඩ ලබා දීම හා ධීවර කාර්මිකයින්ගේ පණිවුඩ ලබා ගැනීම් ද සිදු කරනු ලබයි. තවද, ධීවර යාත්‍රාවලින් ලැබෙන හදිසි ආපදා පණිවුඩ සඳහා එම අවස්ථාවේ සිට එම කාර්යය අවසන් වන තෙක් අවශ්‍ය සියලු කටයුතු සිදු කරනු ලබයි. මෙම සියලු කාර්යයන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සෝදිසි මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ඊට අමතරව,දිස්ත්‍රික්ක 07ක පිහිටි ධීවර වරායන් 25ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර පරීක්ෂක සහ සංවර්ධන නිලධාරි යන නිලධාරීන් විසින් දිවා-රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරික්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබා දීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාළ ලොග් සටහන ලබා ගැනීම, මත්ස්‍ය අස්වැන්න පරීක්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබා දීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදු වී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම, ලොග් සටහන් සහ ලබා ගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

ජාත්‍යන්තර මුහුද වෙත මසුන් මැරීම සඳහා යන සියලු බහුදිනයාත්‍රා,චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ අධීක්ෂණය කිරීම අන්තර් ජාතික නීතිරීති වල අනිවාර්යය අංගයකි. ඒ අනුව, 2015 වර්ෂයේ සිට ජාත්‍යන්තර මුහුදේ මෙහෙයුම් බලපත්‍ර ලබා ගත් යාත්‍රා පමණක් යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් (VMS) මගින් නිරීක්ෂණය කළ ද, ඉහත ජාත්‍යන්තර නීතිරීති සහ මත්ස්‍ය අපනයන අවශ්‍යතාව අනුව සියලුම බහුදිනයාත්‍රා යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය(VMS) මගින් ආවරණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගිණි. බහුදිනයාත්‍රා මගින් සිදු කරන ධීවර නොවන අනෙත් නීතිවිරෝධී කටයුතු (උදා:නීතිවිරෝධී සංක්‍රමණ සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු) හඳුනා ගැනීමේ වියදම් අඩුක්‍රමවේදයක් ලෙස ද මෙම අවශ්‍යතාවය මතු වීතිබිණි.

ඒඅනුව, ඉහත අවශ්‍යතාවයට සරිලන යාත්‍රා නිරීක්ෂණ පද්ධති (VMS) ඒකක 4200කින් සමන්විත සම්පූර්ණ යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රදානයක් ලෙස දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.

නව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියට (VMS), සියලුම වරාය කාර්යාල හරහා ප්‍රවේශවීමේ හැකියාව පවතින අතර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටා ඇති ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) මගින් 24x7 පුරා මධ්‍යගතව එම කටයුතු කළමනාකරණය කරයි. නීතිවිරෝධී ධීවර කටයුතු, මිනිස් ජාවාරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ නීතිවිරෝධී දේශ සීමාතරණය වැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම් සිදු විය හැකි අවදානම් යාත්‍රා හඳුනා ගැනීම මෙම මධ්‍යස්ථානය සතු පහසුකම් මගින් සිදු කළ හැකි ය. එමෙන්ම, හදිසි ආපදා තත්ත්වයන්හි දී ධීවර යාත්‍රා සඳහා පහසුකම් සැලසීමට ද මෙම පද්ධතිය යොදා ගත හැකි ය. මෙම ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය, සියලු නවීන තාක්ෂණය භාවිතයෙන් නවීකරණය කර ඇති අතර, වර්තමානයේදී මෙය ආසියාවේ ඇති අති නවීන අධීක්ෂණ මධ්‍යස්ථානයක් ලෙසද සැළකිය හැකි ය.

එසේම, යාත්‍රා නිරීක්ෂණ ඒකකය, ධීවර මෙහෙයුම් අංශය සහ ධීවර වරායන්වල පිහිටුවා ඇති අන්තර්ජාතික ධීවර කටයුතු ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන උප කාර්යාලයක්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි පිහිටුවා ඇත. මෙම කාර්යාලය මගින් ධීවර නිෂ්පාදන අපනයනයේ දී, විශේෂයෙන් ම, යුරෝපා සංගමයට අයත් රටවල් සඳහා අපනයනයේ දී සෑම මත්ස්‍ය තොගයක් සඳහා ම මසුන් ඇල්ලීමේ සහතික (Catch Certificates) නිකුත් කිරීම සහධීවර නිෂ්පාදන ප්‍රතිඅපනයනය සඳහා මසුන් ආනයනයේ දී අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. දිනපතා ගුවන් මගින් සිදු කරනු ලබන අපනයනයන් සඳහා අවශ්‍ය සහතික කඩිනමින් සහ ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමේ පහසුව සඳහා තත්ත්ව පාලන ඒකකයක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ස්ථාපනය කර ඇති අතර, එය පැය 24 පුරාවට ම (24x7) විවෘතව පවතී.

ගොඩබිමට පැමිණෙන සෑම බහුදින යාත්‍රාවක ම සම්පූර්ණ ගමන් වාරය පිළිබඳව පිහිටීමේ තොරතුරු සහිත යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS) ගමන්මග එම යාත්‍රාවට අදාළ ලොග් පිටුව සමඟ පරීක්ෂා කිරීමෙන් පසු යාත්‍රා නිරීක්ෂණ පද්ධතියේ (VMS)දත්ත සමඟ සැසඳේ නම් පමණක් එම මත්ස්‍ය තොගය අපනයනය කිරීමට හැකි වන ලෙසත් මෙම යාත්‍රාව කිසිඳු නීතිවිරෝධී ධීවර කටයුත්තක් සිදු නොකොට නීත්‍යනුකූලව මසුන් අල්ලා ගෙන පැමිණි යාත්‍රාවක් බවටත් සහතික කර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපන වාර්තාවක් නිකුත් කරනු ලබයි. මෙම සත්‍යාපන වාර්තාව, කටුනායක පිහිටි ගුවන්තොටුපල තත්ත්ව පාලන ඒකකය වෙත යොමු කිරීමෙන් පසුව යාත්‍රාවේ එම ගමන් වාරයට අදාළ මසුන් සඳහා අපනයනය කිරීමට අවශ්‍ය ඇල්ලුම් සහතිකය (Catch Certificate) නිකුත් කරනු ලබයි. මෙම මත්ස්‍යතොරතුරු සත්‍යාපන ක්‍රියාවලිය, පැය 24පුරා ම ආවරණය වන පරිදි සතියේ දින 07 පුරා දිවා-රාත්‍රී (24x7) ක්‍රියාත්මක කිරීමේ කටයුතු, වරාය මෙහෙයුම් කාර්යාල (21ක්), කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි යාත්‍රානිරීක්ෂණ ඒකකය, ජාත්‍යන්තර ධීවර කටයුතු ඒකකය හා කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපලේ ඇති තත්ත්ව පාලන ඒකකය යන කාර්යාලවල සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හේතුවෙන්, බහුදින යාත්‍රාමගින් දිවයිනට රැගෙන එනු ලබන නීත්‍යනුකූල මත්ස්‍ය තොග නියමිත පරිදි වාර්තා සහිතව සහ බලපත්‍ර සහිතව අල්ලා ගන්නා ලද ඒවා බවට සහතික කොට අපනයනය සඳහා යොමු කිරීමට අවස්ථාව හිමි වේ.

## 1.5 දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



# 2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1. විශේෂ ජයග්‍රහණ

1. යාත්‍රා නිරීක්ෂණ උපකරණ සම්බන්ධපවත්නා නීතිවලට අනුකූල නොවීම සම්බන්ධව 2024 වසර තුළ
    - යාත්‍රාපිටත්වීමඅවලංගුකිරීම (Departure cancel). - යාත්‍රා 511
    - නීතිමයපියවරගැනීමසඳහායොමුකිරීම - යාත්‍රා 47
2. නව ධීවර හා ජලජ සම්පත් පනත කෙටුම්පත් කිරීම

    2.1 නව ධීවර හා ජලජ සම්පත් පනත කෙටුම්පත් කර ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. එය 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත පරිච්චින්න කොට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එම කෙටුම්පත් පරික්ෂා කර වෙනත් සහ වැඩිමත් යෝජනා නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කර ඇත.

3. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග

    3.1 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීමේ පනත් 01ක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.

    - 2023 අංක 27 දරණ ධීවර හා ජලජ සම්පත් පනත

    3.2 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග 05ක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.

    - මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මගින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝග 2015 (සංශෝධන)
    - ධීවර මෙහෙයුම් නියෝග ( සංශෝධන )
    - විනෝදයසඳහාමසුන් මැරීමේධීවරකර්මාන්තයකළමනාකරණයකිරීමේනියෝග
    - යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත්වීමේ සහ පැමිණීමේ නියෝග
    - කෘතිම උපස්ථර මත වගා කරන කොරල් විශේෂ ආනයනය සහ අපනයනය කිරීමේ නියෝග

    3.3 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග මාලා 01ක් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

    - ධීවරයින්ගේ විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ නියෝග

3.4 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග මාලා03ක් නීතිකෙටුම්පත් දෙපාර්තමේන්තුවේඅනුමැතියසඳහාඉදිරිපත්කර ඇත.

- මසුන් පරිහරණය සහ බෙදාහැරීමේ නියෝග
- ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීමේ නියෝග - 2023
- ග්‍රාමීය ධීවර සංවිධාන/ දිස්ත්‍රික් සංවිධාන/ ජාතික ධීවර සම්මේලනය පිහිටුවීමේ නියෝග 2023

3.5 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග 02ක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

- 2019 නියමුවන් (දේශීය ධීවර බෝට්ටුවල) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග (සංශෝධන)
- මඩ කකුළුවන් ධීවර කළමණාකරණ නියෝග 2024

3.6 ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන නියෝග මාලා 01ක් කෙටුම්පත් කර ඇත.

- ටින් කරන ලද මසුන් සම්බන්ධ නියෝග

4. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ගණන

- මුහුදු ආහාර අපනයනය සඳහා ස්වස්ථතාසහතික සංඛ්‍යාව 26,210
- මසුන් ඇල්ලීමේ සහතික සංඛ්‍යාව 16,832
- මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන හා මත්ස්‍ය ඇසුරුම් මධ්‍යස්ථාන ලියාපදිංචි සංඛ්‍යාව 65

5. තොරතුරු තාක්ෂණික ප්‍රගතිය

1. ධීවර හැඳුනුම්පත් 10000 පමණ 100% දෙපාර්තමේන්තුවේ සම්පත් පමණක් උපයෝගී කරගෙන මුද්‍රණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ හොඳම වෙබ් අඩවි තෝරා ගැනීමට පවත්වනු ලබන Bestweb.lk තරගාවලියේදී දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට රජයේ වෙබ් අඩවි අංශයෙන් තෙවන ස්ථානය ලබා ගැනීම සම්බන්ධයෙන් සම්මානයක් ලබා ගැනීමට හැකි වීම.
3. දෙපාර්තමේන්තු නිලධාරීන්හට බෙදා දීම සඳහා ALDFG සහ Pelagisko යන ව්‍යාපෘති යටතේ නවතම ටැබ් යන්ත්‍ර 181 ක ප්‍රමාණයක් ලැබීම.
4. ජාලගත මෘදුකාංය (MSDFAR) භාවිතයෙන් රාජකාරී සිදු කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට සාර්ථකව එමගින් ධීවර ලියාපදිංචි කිරීම් (Fishermen Registration) 49000, යාත්‍රාංගන ලියාපදිංචි කිරීම් (Yard Registration) 180, යාත්‍රා සැලසුම් අනුමත කිරීම් (Boat Design) 1535, බෝට්ටු අංක ලියාපදිංචි කිරීම් (Boat Number Registration) 7400, යාත්‍රා ලියාපදිංචි කිරීම් (Boat Registration) 4590, යාත්‍රා අලුත් කිරීම් (Boat Renewal) 4485, මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම් (Operation license) 10200, මෙහෙයුම් බලපත්‍ර අලුත්

කිරීම (Oparation license Renewal) 870, විද්‍යාත්මක දත්ත ඇතුලත් කිරීම් (Scientific Data) 1600, නියමු ලියාපදිංචිය (Skipper license) 9420, මත්ස්‍ය ඇල්ලුම් සහතිකය (Catch Certificate) 1427 ක් පමණ සිදු කිරීමට හැකි වී තිබීම.

5. ඔස්ට්‍රේලියානු රජය යටතේ VMS 1779 ක ප්‍රමාණයක් සවි කරන ලදි.




ඡායාරූප: සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය




ඡායාරූපය:Bestweb.lk තරගාවලියේදී දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට රජයේ වෙබ් අඩවි අංශයෙන් තෙවන ස්ථානය වෙනුවෙන් ලැබුණු සම්මානය

6. විදේශීයරටවල දී අත් අඩංගුවටපත් ධීවරයින් හා යාත්‍රා මුදා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම

| අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව | මුදාගත් ධීවරයින් සංඛ්‍යාව | අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව | මුදාගත් යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| 125 | 60 | 33 | 03 |

7. දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදුසීමාවන්හි පාවී යමින් තිබූ යාත්‍රා බේරාගැනීම

| මුදාගැනීමේ කටයුතු සිදු කළ ධීවරයින් සංඛ්‍යාව | මුදා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කළ ධීවර යාත්‍රා සංඛ්‍යාව | නැව්වල හැපී විනාශ වූ යාත්‍රා | අත් හැර දමන ලද බහුදින යාත්‍රා සංඛ්‍යාව |
|---|---|---|---|
| 102 | 35 | 04 | 06 |

8. මහමුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු සත්‍යාපනය කිරීම

| | | |
|---|---|---|
| 1. | මහ මුහුදේ මෙහෙයුම් වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන | 2197 |
| 2. | මෙහෙයුම් වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන | 2150 |

9. බහුදින යාත්‍රාවලින් සිදුකරන මෙහෙයුම්වලට අදාල ධීවර ලොග් පත්‍රිකා එකතු කිරීම

| | | |
|---|---|---|
| .1 | වරාය මෙහෙයුම් කාර්යාල වෙත ලැබුණු ධීවර ලොග් පත්‍රිකා ගණන | 39438 |
| 2. | ලොග් දත්ත පද්ධතිය වෙත ඇතුලත් කරන ලද ගණන | 30490 |

10. තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීම

| | | |
|---|---|---|
| 1. | මාර්ගගත ක්‍රමයට යාත්‍රා සඳහා ගමන්වාර ලබා දීම | 72794 |
| 2. | IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගනු ලබන දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද යාත්‍රා ඡායාරූප වාර්තා ගණන | 352 |
| 3. | AIS උපකරණ නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීම | 166 |

11. විමර්ශන කටයුතු වල ප්‍රගතිය - 2024

| අනු අංකය | ක්‍රියාකාරකම් | කාර්ය දර්ශක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් මට්ටමේ වැටලීම් සහ නීති විරෝධී ධීවර කටයුතු වලට එරෙහි විමර්ශන හා නෛතික කටයුතු සුපරීක්ෂණය | දිස්ත්‍රික් මට්ටමේ නෛතික කටයුතු පිළිබඳව පවත්වා ගන්නා යාවත්කාලීන දත්ත වාර්තාව | යාවත්කාලීන දත්ත වාර්තාව සක්‍රීයව පවත්වා ගෙන යනු ලැබේ. |
| 02 | පරිපාලන දඩ පැනවීම සඳහා සියළු දිස්ත්‍රික් කාර්යාල වලින් යොමු වන ඉල්ලීම්, අදාල ක්‍රියාවලියට අනුව , ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පරිපාලන දඩ පැනවීමේ ක්‍රමවේදය සකස් කිරීම. | පරිපාලන දඩ පැනවීමට යටත් කරන ලද නඩු සංඛ්‍යාව | 37 |
| 03 | තහවුරු වන නීති විරෝධී කටයුතු වලට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම. | පවත්වන ලද නඩු සංඛ්‍යාව | 0 |
| 04 | යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මඟින් හඳුනාගන්නා ලද නීති කඩ කිරීම සඳහා වන විමර්ශන කටයුතු සිදු කිරීම. | VMS මඟින් නීති කඩ කිරීම් සඳහා වන විමර්ශන ගණන | 800 |
| 05 | විශේෂ වැටලීම් සිදු කිරීම. | සැලසුම් කරන ලද වැටලීම් ප්‍රමාණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිශතය | 0 |
| 06 | ධීවර යාත්‍රා,ධීවර ආම්පන්න,නිෂ්පාදන සහ ධීවර ඇම සැපයුම් ආයතන සම්බන්ධ පරික්ෂා කිරීම් සහ විමර්ශන කටයුතු. | 01.පරික්ෂාවන් ගණන/ | 16 |
| | | 02. නඩු පැවරීම් ගණන | 0 |

12. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීම සඳහා කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම, විධිමත් කිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජීය, ආර්ථික හා සමාජ සුබසාධක තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම ධීවර සංවර්ධන අංශයේ ප්‍රමුඛතම වගකීම වේ.

**ධීවර සංවර්ධන අංශයේ මූලික කාර්යභාරය**

- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම නියාමනය හා අධීක්ෂණය කිරීම.
- ධීවර යාත්‍රා සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම.
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ධීවර ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම හා ප්‍රවර්ධනය කිරීම.
- වෙරළාශ්‍රිත ඉදි කිරීම් ව්‍යාපෘතිවලට අදාලව පාරිසරික ඇගයීම් වාර්තා සඳහා ධීවර කර්මාන්තයන්ට බාධාවක් නොවන පරිදි නිර්දේශ ලබාදීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාල යටිතල පහසුකම් සංවර්ධනය.
- විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ධීවර සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ධීවර කාර්මික රක්ෂණය ක්‍රියාත්මක කිරීම.
- ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරිම මගින් ධීවර සමාජ ආරක්ෂණය තහවුරු කිරීම.
- ධීවර වන්දි ලබා දීම පිළිබඳ කටයුතු කිරීම.
- දියවර කැකුළු ළමා ඉතුරුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- කලපු පරිසර පද්ධතිය සංවර්ධනය හා සංරක්ෂණය විධිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- සියලුම දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් ප්‍රගති සමාලෝචනය කිරීම.
- විශේෂ ධීවර ගැටළු නිරාකරණය කිරීම.

<u>ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරිම</u>

ධීවර කාර්මිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරිම සම්බන්ධ කාර්යයන්වල ප්‍රගතිය

| කාර්යය | 2024.12.31දක්වා ප්‍රගතිය |
|---|---|
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව | 27986 |
| රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | 23756 |
| ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වු සංඛ්‍යාව | 69095 |
| මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරිම් | 28421 |
| ධීවර යාත්‍රාංගන ලියාපදිංචි කිරිම් | 55 |
| ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම් | 19 |
| ධීවර උපකරණ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම් | 07 |




ප්‍රස්ථාරය : රක්ෂණය කරන ලද ධීවර යාත්‍රා සංඛ්‍යාව

ධීවර රැකුම නව රක්ෂණාවරණය හඳුන්වාදීම

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. මෙරට ධීවර කර්මාන්තය සැලකීමේදී කරදිය ධීවර අංශයේ අවදානම මිරිදිය ධීවර අංශයට වඩා ඉහළ අගයක් ගනී. ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙරටධීවරයින් සංඛ්‍යාව 315,720ක් වන අතර මින් 225,070ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටින අතරඉන් 87% ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර34,300ක් බහු දින ධීවර යාත්‍රා වලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරතවේ.මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 266,640ක් වන අතර සෘජු ධීවර කර්මාන්තයෙන් යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000ක් පමණ වේ . එමෙන්ම මෙම අංශයට සම්බන්ධ වක්‍ර රැකියාවෙ නිරත වන හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 03ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ථ ජන ගහනයෙන් 18% ක් පමණ ප්‍රමාණයක් සිය ජීවනෝපාය සලසා ගන්නේ ධීවර කර්මාන්තය ආශ්‍රීතවය.

ශ්‍රී ලංකාවේ සමස්ත ක්‍රියාකාරී ධීවර කාර්මිකයින් ප්‍රමාණය 315,720කි. මේ අතුරින් මෙතෙක් ක්‍රියාත්මකව පැවති රක්ෂණ යෝජනා ක්‍රමයට දායකවූ පිරිස, ක්‍රියාකාරී ධීවර කාර්මික සංඛ්‍යාවන් ආසන්නව ගත් කළ 1.73% ක ප්‍රමාණයකි. පැවති රක්ෂණ යෝජනා ක්‍රමයේ අඩුපාඩු හා ගැටලු හඳුනාගෙන ධීවර කාර්මිකයින් සඳහා වඩාත් ඵලදායි හා සහනදායී වාරික මුදලකින් යුත් නව රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අත්‍යවශ්‍යතාව පැනනැගී ඇති බැවින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එක්ව “ධීවර රැකුම” පුද්ගල හදිසි අනතුරු රක්ෂණය හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන “ධීවර රැකුම” පුද්ගල හදිසි අනතුරු රක්ෂණය යටතේ ධීවර කාර්මික මහතාගේ අභාවයකදී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මුදල යැපෙන්නන් වෙත ලබා දෙන අතර මුළුමුදලින් අඩක් බිරිඳටත් අනෙක් කොටස පවුලේ බාලවයස්කාර දරුවන් අතර බෙදී යා යුතුය. රක්ෂණ සංස්ථාව මඟින් විකල්ප ක්‍රම 03ක් හඳුන්වා දී ඇත.

<u>ධීවර රැකුම රක්ෂණාවරණයේ ආවරණ විස්තර</u>

| ආවරණ විස්තර | රක්ෂිත මුදල (රු) | | |
|---|---|---|---|
| 01. පුද්ගල හදිසි අනතුරු රක්ෂණය | විකල්ප 01 | විකල්ප 02 | විකල්ප 03 |
| හදිසි අනතුරු රක්ෂණය | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවය | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| සදාකාලික අර්ධ අකර්මන්‍යතාවය | 600,000 | 750,000 | 1,000,000 |
| 02. අතුරුදහන්වීම සඳහා | | | |
| ධීවර කටයුතු වල නිරත වී සිටියදී සිදුවන හදිසි අනතුරක් හේතුවෙන් ධීවර මහතාගේ අතුරුදහන් වීමකදී ප්‍රතිලාභ ගෙවීම අතුරුදහන් වී මාස 05ක් ගත වූ පසු ආරම්භ කරනුලබයි. | මසකට 7,500 මාස 12ක් දක්වා | මසකට 7,500 මාස 12ක් දක්වා | මසකට 7,500 මාස 12ක් දක්වා |
| වසරකට වැඩි කාලයක් අතුරුදහන් වී ගත වුවහොත් රක්ෂිත මුදලින් ඉහත ගෙවනු ලැබූ වන්දි මුදල අඩුකල පසු ඉතිරිය ගෙවනු ලබයි. | 1,200,000 | 1,500,000 | 2,000,000 |
| 03. රෝහල් ගතවීමේ දීමනාව<br>හදිසි අනතුරු හෝ අසනීප සඳහා රෝහල්ගතවීම් වලදී එක් ධීවර පවුලකට වර්ෂයකට උපරිම දින 14ක් සඳහා හිමිකම් ගෙවනුලබයි.<br>ධීවරයා හා කලත්‍රයා .අවු -18 සිට 65 දක්වා<br>අවිවාහක, රැකියා විරහිත ළමුන් අවු.-21දක්වා | දිනකට රු.500=/ (උපරිම දින 14) | දිනකට රු.500=/ (උපරිම දින 14) | දිනකට රු.500=/ (උපරිම දින 14) |
| 04. අධ්‍යාපන වියදම් දීමනාව<br>පාසල් යන දරුවන්ගේ අධ්‍යාපන වියදම් සඳහා උපරිම දරුවන් දෙදෙනෙකු සඳහා මසකට රු.1,000 බැගින් වර්ෂයක් සඳහා ගෙවනු ලැබේ. | 1,000 | 1,000 | 1,000 |
| 05. අවමංගල්‍යාධාර ප්‍රතිලාභය (ස්වභාවික මරණ හේතුවෙන් පමණක් ගෙවනු ලබයි.) | 200,000 | 200,000 | 200,000 |
| 06. ගුවන් ටිකට් පත් ආවරණය<br>ධීවර මෙහෙයුම් හේතුවෙන් වෙනත් රටකට ගසාගෙන යෑම / අත්අඩංගුවට පත්වීමකදී | 40,000 | 40,000 | 40,000 |

**ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම**

මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය ඒකාබද්ධව රජයේ ඍජු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අයකිරීමක් සිදුනොකරයි. මේ යටතේ ධීවර කටයුතුවල යෙදී සිටියදී සිදුවන ස්වාභාවික ආපදාවන් හේතුවෙන් මියයන ධීවර කාර්මිකයෙකු සඳහා ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක වන්දි මුදලක් ලබාදෙනු ලබයි.2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ප්‍රතිලාභී පවුල් 5ක් සඳහා වන්දි ලබාදී ඇත. තවද ජීවිතක්ෂයට පත්වූ ඩෙවොන් 05 ධීවර යාත්‍රාවේ ධීවර කාර්මිකයින් හතර දෙනාගේ පවුල් සඳහා එක් අයෙකු වෙනුවෙන් රු.ලක්ෂ 05 බැගින් සහන දීමනාවක් ලෙස රු 2,000,000.00ක් ලබාදීමට කටයුතු කර ඇත. රජය විසින් ස්වාභාවික මරණයකදී ගෙවනු ලබන රුපියල් මිලියන 1ක දීමනාව ලබාගැනීම සඳහා එම මරණය සිදු වූයේ ස්වභාවික ආපදා තත්ත්වයක් යටතේ සිදුවූ බව තහවුරු කල යුතුය. ඒ සඳහා ආපදා සිද්ධි වාර්තාවක් ලබා දීම අනිවාර්ය වේ.

**දියවර දිරිය ණය යෝජනා ක්‍රමය**

නව තාක්ෂණය හඳුන්වා දීම තුලින් ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමත් ගුණාත්මක තත්වයෙන් යුතු වැඩි මත්ස්‍ය නිෂ්පාදනයක් ලබා ගැනිමත් අරමුණු කර ගනිමින්, ධීවර යාත්‍රා වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව සඳහා සහන සැලසීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ලංකා බැංකුව සමග එක්ව දියවර දිරිය අඩු පොලි ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකු සඳහා රුපියල් මිලියන 15ක උපරිමයකට යටත්ව ණය ලබාදෙන අතර පොළී අනුපාත පහත පරිදි වේ.

- ණය මුදල රුපියල් මිලියන 2ට අඩු නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 5%.
- ණය මුදල රුපියල් මිලියන 2ට වැඩි නම් ණය ලාභියාගෙන් අය කරන පොලි අනුපාතය 7%.
- එක් ප්‍රතිලාභියෙකු සඳහා රජය මගින් 4%ක පොලි සහනාධාරයක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දේ.
- ධීවර යාත්‍රාංගන වැඩි දියුණු කිරිම්, අඩි 55ට වැඩි ධීවර යාත්‍රා නිෂ්පාදනය, නව තාක්ෂණය වැඩි දියුණු කිරීම් (RSW, CSW), මරුවැල් පන්න හා වින්ච් සවි කිරීම් සඳහා ණය ලබා දිමේදි ප්‍රමුඛතාව ලබා දේ.
- දියවර දිරිය අදියර එක (1) යටතේ ප්‍රතිලාභීන් 755දෙනෙකු සඳහා රුපියල් බිලියන1ක ණය මුදලක් ලබා දී ඇති අතර දියවර දිරිය අදියර දෙක (11) යටතේ ප්‍රතිලාභීන් 1017දෙනෙකු සඳහා රුපියල් බිලියන1.8ක ණය මුදලක් ලබා දී ඇත.

මේ වන විටත් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහි 4% ක පොලි වාරික මුදල් ලංකා බැංකුව වෙත යොමු කරන අතර එය 2031 වන තෙක් ගෙවීම් සිදු කිරීමට ඇත.

**දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම**

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්ණායකයන්ට අනුව ධීවර වෘත්තිය වඩාත් අභියෝගාත්මක, අනතුරුදායක හා අවදානම් සහගත රැකියාවක් ලෙස නම් කර ඇත. අතිබහුතරයක් ධීවර කාර්මිකයින්ගේ පවුල් වල ආර්ථිකය සම්පූර්ණයෙන්ම එම පවුලේ ප්‍රධානියා වන ධීවරයා උපයන ආදායම මත රඳාපවතී .එම ධීවර පවුල් වල පෝෂණය , අධ්‍යාපනය ,සෞඛ්‍ය ආරක්ෂිතභාවය ද සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ ද ධීවරයාගේ තනි ආදායම මතය. ධීවර කාර්මිකයාට සිදුවන අනතුරු නිසා එම පවුලේ ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටීමක් සිදුවන අතර මෙහිදී ප්‍රධාන වශයෙන් ධීවර පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය බිඳවැටීම බහුලව පෙන්නුම් කරයි. ඒ අනුව ධීවර පවුල් වල සමාජ ආරක්ෂණය තහවුරු කිරීමටත්, ධීවර කර්මාන්තයට තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීමටත්, ධීවරයින් තම පවුලේ අනාගතය වෙනුවෙන් ආයෝජන/ඉතිරිකිරීම් පුරුද්දක් ඇති කිරීම හා අරපිරිමැස්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත.

ඒ අනුව ළමුන් සඳහා වඩාත් පුළුල් ආවරණයක් ලබාදීම සඳහා ධීවර අමාත්‍යංශයේ ඉල්ලීම මත ලංකා බැංකුව විසින් ධීවර ළමුන් සඳහාම විශේෂිත වූ ‘දියවර කැකුළු’ ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.




**ඡායාරූපය: දියවර කැකුළු ළමා ඉතුරුම් ගිණුම**

**2024 වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් සහ එහි ප්‍රගතිය**

**ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන ධීවර යාත්‍රා වන පිටත එන්ජිම සහිත කුඩා යාත්‍රා (OFRP) හා පාරම්පරික යාන්ත්‍රික යාත්‍රා (MTRB) සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ භූමිතෙල් ලබාදීමේ වැඩසටහන 2023-2024 [OFRP (Out board fiber Reinforced Plastic Boat), MTRB (Mechanized Traditional Boat)]**

චීන සමූහාණ්ඩුව මඟින් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවගේ පරිභෝජනය සඳහා ආධාර වශයෙන් පිරිනැමුණු ඩීසල් ලීටර් මිලියන 3.79 වෙනුවට සී/ස ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් කුඩා පරිමාණ ධීවරයින්ගේ පරිභෝජනය සඳහා භූමිතෙල් ලබාදීමට තීරණය කරන ලද අතර එවකට පැවති මිල අනුව භූමිතෙල් ලීටර මිලියන 4.32ක් නිදහස් කිරීමට හැකියාව පවතින බව නිරීක්ෂණය විය. මෙම ඉන්ධන නිකුත් කිරීම අදියර දෙකක් යටතේ සිදුකරනු ලැබිය. ඒ අනුව පළමු අදියරේදී භූමිතෙල් ලීටර 75ක් හා දෙවන අදියරේදී භූමිතෙල් ලීටර 78ක් බැගින් අදියර දෙකම අවසානයේදී එක් ධීවර යාත්‍රාවක් සඳහා භූමිතෙල් ලීටර 153ක් බැගින් ලබාදීමට තීරණය විය

එමගින් ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි, දිවයින පුරා සක්‍රිය ධීවර කර්මාන්තයේ යෙදෙන OFRP හා MTRB යාත්‍රා සඳහා එම සහනය ලබාදිමට අපේක්ෂා කරන ලදි. ඒ අනුව කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, කල්මුණේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චි, යාපනය, මුලතිව්, මන්නාරම, පුත්තලම, හලාවත හා මීගමුව යන ධීවර දිස්ත්‍රික්ක 15හි මේ වන විට සක්‍රිය ධීවර යාත්‍රා ලෙස හඳුනාගත් යාත්‍රා 25,564ක් සඳහා පළමු අදියර යටතේද, යාත්‍රා 28,806 ක් සඳහා දෙවන අදියර යටතේද එම සහනය ලබා දීමට අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව පළමු අදියර යටතේ ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 96ක් මඟින් සිදුකරනු ලැබූ අතර එක් යාත්‍රාවකට ලීටර් 75 බැගින් OFRP හා MTRB යාත්‍රා 24,340 ක් සඳහා භූමිතෙල් ලීටර් 1,825,500 ක් නිකුත් කිරීම සිදු කරන ලදී.

දෙවන අදියර යටතේ ඉන්ධන නිකුත් කිරීම ඉන්ධන පිරවුම්හල් 97ක් මඟින් සිදුකරනු ලැබූ අතර එක් යාත්‍රාවකට ලීටර 78 බැගින් OFRP හා MTRB යාත්‍රා 24,024 ක් සඳහා භූමිතෙල් ලීටර 1,873,872ක් නිකුත් කරන ලද අතර පළමු අදියරයේදී ඉන්ධන නිකුත් නොකරන ලද යාත්‍රා සඳහා එක් යාත්‍රාවකට ලීටර 153 බැගින් OFRP හා MTRB යාත්‍රා 4,084 ක් සඳහා භූමිතෙල් ලීටර 624,852ක් නිකුත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව යාත්‍රා 28,108 ක් සඳහා භූමිතෙල් ලිටර 2,498,724ක් දෙවන අදියර යටතේ 2024.03.05 දින වනවිට බෙදාහැරීම සිදුකර ඇත.

**පළමු හා දෙවන අදියරයන් යටතේ භූමිතෙල් බෙදා හැරීම**

පළමු හා දෙවන අදියරයන් යටතේ භූමිතෙල් බෙදාහැරීම

| දිස්ත්‍රික්කය | පළමු අදියර | | දෙවන අදියර | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | භූමි තෙල් ලබා දීමට අනුමත වූ යාත්‍රා සංඛ්‍යාව | 2023.07.28 දින වන විට භූමි තෙල් ලද මුළු යාත්‍රා සංඛ්‍යාව | භූමි තෙල් ලබා දීමට අනුමත වූ යාත්‍රා සංඛ්‍යාව | | | 2024.03.05 දින වන විට භූමි තෙල් ලද මුළු යාත්‍රා සංඛ්‍යාව | | | | | |
| | | | 78 (L) | 153 (L) | මුළු යාත්‍රා සංඛ්‍යාව (අනුමත) | දෙවන අදියර පමණක් ( යාත්‍රා ) | නිකුත් කළ භූමි තෙල් (78L) | පළමු හා දෙවන අදියර (යාත්‍රා) | නිකුත් කළ භූමි තෙල් (153L) | මුළු යාත්‍රා සංඛ්‍යාව (නිකුත් කළ) | නිකුත් කළ භූමි තෙල් ලිටර් (මුළු) |
| මඩකලපුව | 1796 | 1725 | 1727 | 124 | 1851 | 1711 | 133458 | 111 | 16983 | 1822 | 150441 |
| කොළඹ | 364 | 291 | 291 | 114 | 405 | 287 | 22386 | 112 | 17136 | 399 | 39522 |
| හලාවත | 1669 | 1430 | 1428 | 449 | 1877 | 1391 | 108498 | 395 | 60435 | 1786 | 168933 |
| ගාල්ල | 702 | 691 | 691 | 110 | 801 | 678 | 52884 | 105 | 16065 | 783 | 68949 |
| යාපනය | 5478 | 5282 | 5283 | 642 | 5925 | 5271 | 411138 | 618 | 94554 | 5889 | 505692 |
| කිලිනොච්චිය | 1045 | 1021 | 1020 | 140 | 1160 | 1018 | 79404 | 139 | 21267 | 1157 | 100671 |
| කළුතර | 418 | 412 | 412 | 41 | 453 | 411 | 32058 | 39 | 5967 | 450 | 38025 |
| කල්මුනේ | 1000 | 973 | 973 | 155 | 1128 | 968 | 75504 | 146 | 22338 | 1114 | 97842 |
| මන්නාරම | 2431 | 2309 | 2310 | 714 | 3024 | 2254 | 175812 | 634 | 97002 | 2888 | 272814 |
| මාතර | 1015 | 982 | 982 | 76 | 1058 | 963 | 75114 | 70 | 10710 | 1033 | 85824 |
| තංගල්ල | 966 | 946 | 946 | 101 | 1047 | 939 | 73242 | 99 | 15147 | 1038 | 88389 |
| ත්‍රිකුණාමලය | 3545 | 3537 | 3542 | 380 | 3922 | 3535 | 275730 | 376 | 57528 | 3911 | 333258 |
| පුත්තලම | 2617 | 2502 | 2496 | 599 | 3095 | 2394 | 186732 | 456 | 69768 | 2850 | 256500 |
| මීගමුව | 1405 | 1207 | 1208 | 357 | 1565 | 1181 | 92118 | 334 | 51102 | 1515 | 143220 |
| මුලතිව් | 1113 | 1032 | 1032 | 461 | 1493 | 1023 | 79794 | 450 | 68850 | 1473 | 148644 |
| **එකතුව** | **25564** | **24340** | **24341** | **4463** | **28804** | **24024** | 1873872 | **4084** | 624852 | **28108** | 2498724 |

**ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - (කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ බටහිර පර්යන්තය සංවර්ධනය සඳහා වැලි ලබා ගැනීම හේතුවෙන් ධීවර කාර්මිකයන්ට සිදුවූ බලපෑම අවම කිරීම)**

කොළඹ වරාය බටහිර පර්යන්ත විශාලන ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත් ධීවර කාර්මිකයින්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ බටහිර පර්යන්ත සංවර්ධන සමාගම, ධීවර අමාත්‍යාංශය රුපියල් මිලියන 140 ක මුදලක් වෙන් කර ඇත. එම මුදල් මෙම ව්යාපෘතිය මගින් වැඩි බලපෑමක් එල්ල වන ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක වල ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා භාවිතා කිරීමට නියමිතය. මීට සමගාමීව මීගමුව දිස්ත්‍රික්කයේ සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ නියුතු ධීවරයින් 25 දෙනෙකුට තෙප්පන් ලබාදීම දැනට සිදු කර අවසන්ය. මේ සඳහා රුපියල් මිලියන 3ක් වෙන් කිරීමට ධීවර අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබාදුනි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ සුළු පරිමාණ ධීවර කර්මාන්තයේ නියුතු ධීවරයින්ගේ ධීවර කර්මාන්තය වෙනුවෙන් ඇති සක්‍රිය දායකත්වය වැඩි කිරීමත්, ඔවුන්ගේ මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමත්, ජීවනෝපාය වැඩි දියුණු කිරීමත්ය. මෙම මුලපිරීම තුලින් දේශීය ධීවර ප්‍රජාවට තිරසාර සහ සමෘද්ධිමත් අනාගතයක් අපේක්ෂා කෙරේ.

මෙම තෙප්පන් නිෂ්පාදනය කරන ලද්දේ සී-නෝර් පදනම(Cey- Nor Foundation) විසිනි. 2024.01.26 දින මෙම තෙප්පන් තෝරාගත් ප්‍රතිලාභීන් වෙත බෙදා දෙන ලදී.

හඳුනාගෙන ඇති තවත් ව්‍යාපෘතියක් වන ලුනාව බොක්ක ආශ්‍රිත තොටුපල/ දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට සිදු කෙරෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. එම කටයුතු සිදු කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. මේ සඳහා එම දෙපාර්තමේන්තුව වෙත රු. 44,762,707.50 ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය සඳහා නිකුත් කර ඇත. ඒ අනුව අදාළ අවබෝධතා ගිවිසුම ජුනි මාසයේදී අත්සන් කළ අතර ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ දියකඩනයේ ව්‍යුහාත්මක අඛණ්ඩතාව සහ ප්‍රත්‍යස්ථභාවය ඉහළ නැංවීම සහ මුහුදු දියවැල් සහ ප්‍රචන්ඩ රළ පහරට ඔරොත්තු දීම සහ ධීවර ක්‍රියාකාරකම් සඳහා තොටුපලෙහි ආරක්ෂාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි.

තවද මෙම රුපියල් මිලියන 140 ක ඉතිරි මුදල යොදා ගනිමින් සිදුකිරීමට නියමිත නව ව්‍යාපෘති මේ වන විට හඳුනාගෙන ඇත.

**2021 මැයි මස 21 වන දින සිදු වූ MV X Press Pearl භාණ්ඩ ප්‍රවාහන නෞකාව ගිනිගැනීමේ සිද්ධිය හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම වෙනුවෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රගතිය**

ඉන්දියාවේ හසිරා වරායේ සිට නයිට්‍රික් අම්ලය මෙට්‍රික් ටොන් 25ක්, තවත් රසායනික ද්‍රව්‍ය, රූපලාවන්‍ය ද්‍රව්‍ය, බංකර් ඔයිල් මෙට්‍රික් ටොන් 278ක් සහ සමුද්‍ර වායු තෙල් මෙට්‍රික් ටොන් 50ක් සමඟ කන්ටේනර් 1,486ක් රැගෙන යමින් තිබූ සිංගප්පූරු ධජය සහිත MV Xpress Pearl භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාව 2021 මැයි මස 21 දින ශ්‍රී ලංකාවේ වෙරළට කිලෝමීටර් 9.5ක් ඔබ්බෙන් නැංගුරම් ලා තිබියදී ගිනි ගන්නා ලදි. එමඟින්ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනිකද්‍රව්‍ය කාන්දුවීම් හේතුවෙන් රටේ බටහිර වෙරළ තීරයේ ධීවර කර්මාන්තයට සැලකිය යුතු ආර්ථික හානියක් සිදුවිය. කළුතර සිට මීගමුව දක්වා වෙරළබඩ ප්‍රදේශයේ තෙල්, රසායනික ද්‍රව්‍ය සහ පිළිස්සුනු ද්‍රව්‍ය විශේෂයෙන් ප්ලාස්ටික් කැබලි වලින් වෙරළ තීරය දූෂණය වීම නිරීක්ෂණය විය. ප්ලාස්ටික් කැබලි, තෙල් සහ රසායනික කාන්දු වීම වෙරළබඩ ධීවර කර්මාන්තයට සහ

සාගර පරිසර පද්ධතිවලට ඉහළ සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදි. මෙම අනතුර කොරල්පර, මුහුදු තණකොළ, මත්ස්‍ය වාසස්ථාන ආදී සමස්ථ පරිසර පද්ධතියටමබරපතල බලපෑම් එල්ල කරන බව විශේෂඥයෝ පවසන ලදි. එබැවින් MV Xpress Pearl යාත්‍රාවේ බලපෑම පුළුල් වන අතර කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන බලපෑම් ඇති කිරීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජීය සහ ආර්ථික සහ සෞඛ්‍ය අංශ කෙරෙහි ඇති විය හැකි හානියේ අහිතකර බලපෑම් අවම කර ගැනීමට සහ ධීවරයින් සහ මුහුදු ආහාර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇත. ඒ අනුව මීගමුව, කළුතර සහ කොළඹ ධීවර දිස්ත්‍රික්කවල ධීවර ක්ෂේත්‍රයට ක්ෂණික අහිතකර බලපෑම් අවම කරගැනීම සඳහා ධීවර කටයුතු තහනම් කරන ලදී. තාවකාලික මත්ස්‍ය තහනම 2021-05-21 දින පනවා ඇති අතර එය නාරා ආයතනයේ විද්‍යාත්මක නිර්දේශ මත පදනම්ව 2022-06-05 දක්වා ක්‍රියාත්මක විය.

MV Xpress Pearlහිසුන්බුන් හේතුවෙන් පරිසර දූෂණය වීමට එරෙහිව පූර්ව ආරක්ෂණ පියවරක් ලෙස සංඛ්‍යාත්මක ආකෘති අධ්‍යනයන් මත පදනම්වදූෂක පැතිරීමේ හැකියාව හඳුනාගනිමින්, NARA විසින් කිලෝමීටර් 65ක වෙරළ තීරයේ වර්ග කිලෝමීටර් 457ක අක්වෙරළ ප්‍රදේශයක් තහනම් කිරීමට නිර්දේශ කරන ලදි. උතුරේ මහඔය ගං මෝය සහ දකුණේ පානදුර මසුන් ඇල්ලීම තහනම් ලෙස ප්‍රකාශ කරන ලදි. ප්‍රදේශයේ දීර්ග කාලයක් තිස්සේ පැවති මත්ස්‍ය තහනම හේතුවෙන් සෘජු ධීවරයින් සහ ධීවර කර්මාන්තයේ වක්‍ර ප්‍රතිලාභීන් සැලකිය යුතු පිරිසක් මෙම සිද්ධියෙන් පිඩාවටපත්වී ඇති අතර එසේ පිඩාවට පත් පාර්ශවයන් ලෙස ධීවරයින් කාණ්ඩ 23ක් සහ ධීවර කර්මාන්තයට සම්බන්ධ වෙනත් වෘත්තීන් වර්ග 24ක් හඳුනාගෙන ඇත.

බලපෑමට ලක්වූ සෘජු ධීවරයින් පිළිබඳ තොරතුරු

| දිස්ත්‍රික්කය | සෘජු බලපෑමට ලක්වූ ධීවර පරීක්ෂක කොට්ඨාශ සංඛ්‍යාව | සක්‍රිය ධීවර කාර්මිකයින් සංඛ්‍යාව | බලපෑමට ලක්වූධීවර යාත්‍රා |
|---|---|---|---|
| මීගමුව | 13 | 11,081 | IMUL 40<br>IDAY 60<br>OFRP 2015<br>NTRB 1484<br>MTRB 02 |
| කොළඹ | 10 | 3,250 | IMUL 11<br>IDAY 14<br>OFRP 446<br>NTRB 294<br>MTRB 01 |
| කළුතර | 02 | 701 | OFRP 47<br>NTRB 33 |

**බහුදිනධීවර යාත්‍රා (**IMUL), **එක්දින ධීවර යාත්‍රා (1** Day) **පිටත එන්ජින් සහිත එක්දින ධීවර යාත්‍රා (**OFRP), **පාරම්පරික ධීවර යාත්‍රා (**NTRB), **යාන්ත්‍රිකරණයකල** (MTRB)

**බලපෑමට ලක්වූවක්‍ර ධීවරයින් පිළිබඳ තොරතුරු**

| දිස්ත්‍රික්කය | ධීවර කාර්මිකයින් සංඛ්‍යාව |
|---|---:|
| මීගමුව | 3,866 |
| කොළඹ | 851 |
| කළුතර | 171 |

**ධීවර අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද වන්දි ප්‍රමාණය**

සෘජු හා වක්‍ර ධීවරයින් සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණ

| දිස්ත්‍රික්කය | ලබාදුන් වන්දි ප්‍රමාණය (රුපියල් ) | | | | |
|---|---|---|---|---|---|
| | 1 වන අදියර | 2 වන අදියර | 3 වන අදියර | 4 වන අදියර | එකතුව |
| මීගමුව | 206,197,500.00 | 242,825,000.00 | 551,220,000.00 | 998,237,548.00 | 1,998,480,048.00 |
| කොලඹ | 58,942,500.00 | 74,720,500.00 | 205,233,125.00 | 288,319,656.00 | 627,215,781.00 |
| කළුතර | 14,170,000.00 | 16,312,500.00 | 37,285,000.00 | 72,558,360.00 | 140,325,860.00 |
| රු. 5000 දීමනාව වෙනුවෙන් | 67,000,000.00 | | | | 67,000,000.00 |
| දැල්ආම්පන්න සඳහා | 2,067,515.00 | | | 4,474,410.00 | 6,541,925.00 |
| ජලජීවීවගාවන්ට සිදු වූ හානි පුරණය | | 1,154,930.00 | | | 1,154,930.00 |
| එකතුව | 348,377,515.00 | 335,012,930.00 | 793,738,125.00 | 1,363,589,974.00 | 2,773,718,544.00 |

**පරිපාලන වියදම් දීමනාව ලබා දීම**

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ශ්‍රී ලංකා මුහුදු තීරයේ දී ගිනි ගෙන මුහුදු බත් වීම හේතුවෙන් සිදු වූ හානිය හඳුනා ගැනීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් එකතු වී කටයුතු කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල යන රාජ්‍ය ආයතන ඉතා විශාලදායකත්වයක් ලබා දුන් අතර මේ වන විට ද අවශ්‍ය සියළු කටයුතු සඳහා සහයෝගය ලබා දෙමින් පවතී.

ඒ අනුව, ධීවර ක්ෂේත්‍රයට සිදු වූ හානි තක්සේරු කිරීම, ජීවිකාව අහිමි වූ පුද්ගලයන් හඳුනා ගැනීම, හා වන්දි ගෙවීම ඇතුළු පරිපාලනමය කාර්යයන් සිදු කිරීම වෙනුවෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අදාළ රාජකාරි ඉටු කරන ලද නිලධාරීන්292දෙනෙකු සඳහා 2021.05.21 දින සිට 2023.12.31 දක්වා සිදුකරන ලද රාජකාරිය වෙනුවෙන් රාජකාරි කල කාල සිමාව අනුව දීමනාවක් ගෙවීම සිදුකරන ලදී.

**ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීම**

ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර ප්‍රජාවගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර නිකුත් කිරීම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය විසින් සිදු කරනු ලබයි.

2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා සංවර්ධන අංශය විසින් නිකුත් කර ඇති ධීවර හැඳුනුම්පත් සහ යාත්‍රා නියමු බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

නිකුත්කර ඇති මුළු ධීවර හැඳුනුම්පත් සංඛ්‍යාව - 1,528
නිකුත්කර ඇති මුළු යාත්‍රා නියමු බලපත්‍ර සංඛ්‍යාව - 871

**කලපු සංවර්ධනය (සංවර්ධන අංශය)**

- **පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව ගැසට් කිරීම**

2010 අගෝස්තු 4 වන දින අංක 1665/17 දරණ අංක යටතේ පුත්තලම කලපුව කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 2013 අංක 35 දරණ සංශෝධිත ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුව පුත්තලම කලපු පරිසර පද්ධතියේ සංරක්ෂණ, සංවර්ධන හා කළමනාකරණය හා ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා නැවත GPS පාඨාංක සහිතව ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සිදු කරමින් පවතී.

- **පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීම**

2024 වර්ෂයේ පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් 2024අප්‍රේල් 24, 25, 30 සහ මැයි 09 යන දින තුළ පවත්වන ලදි.





ඡායාරූප:පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන අතරතුර

- **හලාවත ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින් දැනුවත් කිරීම**

2024 වර්ෂයේ හලාවත ධීවර දිස්ත්‍රික්කයේ හලාවත කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් 04 ක් 2024 අප්‍රේල් 08, 29 සහ මැයි 03 යන දින තුළ පවත්වන ලදි.

- **මාතර ධීවර දිස්ත්‍රික්කයේ ධීවරයින්දැනුවත්කිරීම**

2024 වර්ෂයේ මාතර ධීවර දිස්ත්‍රික්කයේ ගරාඬුව කලපුවේ කලපු කළමනාකරණ කමිටුවල ඉදිරි ක්‍රියාකාරීත්වය හා ධීවර ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම පිළිබඳ ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024 පෙබරවාරි 22 දින පවත්වන ලදි.

- **හලාවත කොග්ගල හා ගරාඬුව යන කලපුවල ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම**

ගාල්ල දිස්තික්කයේ කොග්ගල කලපුවත්, මාතර දිස්ත්‍රික්කයේ පිහිටි ගරාඬුව කලපුවත් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි හලාවත කලපුවත් එම කලපු පරිසර පද්ධතියේ පාරිසරික තත්වයන් තිරසාරව පවත්වා ගැනීමටත් ඒ තුළින් කලපුව ආශ්‍රිතව සිදුකරන්නාවූ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන මෙම ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම ගැසට් කිරීමට කටයුතු කර ඇත.

- **පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව වටා කණු සිටුවීම සඳහා කණු ප්‍රවාහනය කිරීම**

පුත්තලම ධීවර දිස්ත්‍රික්කයේ පුත්තලම කලපුව වටා සිටුවීම සඳහා මායිම් කණු ප්‍රවාහනය කර අවසන්ව ඇත.

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් සහනාධාර ලබාදීමේ වැඩසටහන 2024**

| | **දිස්ත්‍රික්කය** | **බෙදා දුන් සහල් ප්‍රමාණය (50kg සහල් මලු)** |
|---|---|---|
| 1 | යාපනය | 7129 |
| 2 | කිලිනොච්චි | 1174 |
| 3 | මන්නාරම | 4226 |
| 4 | මුලතිවු | 2818 |
| 5 | මඩකලපුව | 6504 |
| 6 | ත්‍රිකුණාමලය | 5640 |
| 7 | කල්මුණේ | 4288 |
| **එකතුව** | | **31779** |

වගුව:සහල්සහනාධාරය බෙදා හැරීමේ සාරාංශය








ඡායාරූප: චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් බෙදාදීමේ අවස්ථා

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ පෙර සැකසූ නිවාස 500ක් ලබාදීමේ වැඩසටහන 2024**

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 750ක වටිනාකමකින් යුත් පෙර සැකසූ නිවාස 500ක් පරිත්‍යාග කර ඇති අතර එම පෙර සැකසූ නිවාස යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා බෙදා දීමට නියමිතය. මෙම පෙර සැකසූ නිවාස පහත සඳහන් ආකාරයට අදාළ දිස්ත්‍රික්ක වලට ප්‍රවාහනය කර ඇත.

පෙර සැකසූ නිවාස බෙදා හැරීමේ සාරාංශය

| **දිස්ත්‍රික්කය** | **නියම කල පෙර සැකසූ නිවාස ගණන** | **ප්‍රවාහනය කල පෙර සැකසූ නිවාස ගණන** |
|---|---:|---:|
| යාපනය | 116 | 116 |
| කිලිනොච්චි | 64 | 64 |
| මන්නාරම | 64 | 64 |
| මුලතිව් | 64 | 64 |
| මඩකලපුව | 64 | 64 |
| කල්මුණේ | 64 | 64 |
| ත්‍රිකුණාමලය | 64 | 64 |
| **එකතුව** | **500** | **500** |

ත්‍රිකුණාමලය, මන්නාරම, යාපනය හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල එක් නිවසක් ආදර්ශයක් ලෙස සකස් කර ඇති අතර එම ආදර්ශ නිවාස ප්‍රතිලාභින්ට පෙන්වා පෙර සවි නිවාසයක් ලබා ගැනීමට කැමැත්ත ලබාගනිමින් පවතී. ත්‍රිවිධ හමුදාව විසින් මෙම පෙර සවි නිවාස ඉදිකිරීමට ශ්‍රම දායකත්වය ලබා දීමට එකඟව ඇත.




ඡායාරූප: ආදර්ශ පෙර සැකසූ නිවාස

ත්‍රිකුණාමලය දිස්ත්‍රිකයේ මේ වනවිටත් ප්‍රතිලාභීන් 64දෙනා හඳුනාගෙන අවසන්ව ඇත. ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් ප්‍රථමයෙන්ම මෙම නිවාස ඉදිකිරිම ආරම්භ කිරීමට නියමිතය.

**උතුරු හා නැගෙනහිර පළාත් වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා චීන සමූහාණ්ඩු ආධාර යටතේ මත්ස්‍ය දැල් 75000ක් ලබාදීමේ වැඩසටහන 2024**

චීන සමූහාණ්ඩු ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට රුපියල් මිලියන 500ක වටිනාකමකින් යුත් මත්ස්‍ය දැල්75,000ක් පරිත්‍යාග කර ඇති අතර එම මත්ස්‍ය දැල් යාපනය, කිලිනොච්චි, මඩකලපුව, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය හා කල්මුණේ යන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩු ආදායම්ලාභී ධීවර කාර්මිකයින් සඳහා බෙදා දීමට නියමිතය. මෙම මත්ස්‍ය දැල් පහත සඳහන් ආකාරයට අදාළ දිස්ත්‍රික්ක වලට ප්‍රවාහනය කර ඇත.

දැල් සහනාධාරය බෙදා හැරීමේ සාරාංශය

| | **දිස්ත්‍රික්කය** | **තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | **එක් එක් දිස්ත්‍රික්කයකට අනුමත හා ප්‍රවාහනය කල දැල් සංඛ්‍යාව** | **දැල් බෙදා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| 1 | යාපනය | 3614 | 21684 | 2384 |
| 2 | ත්‍රිකුණාමලය | 2625 | 15750 | 1196 |
| 3 | මන්නාරම | 2309 | 13854 | 1504 |
| 4 | මඩකලපුව | 1589 | 9534 | 1583 |
| 5 | මුලතිවු | 583 | 3498 | 437 |
| 6 | කල්මුණේ | 887 | 5322 | 791 |
| 7 | කිලිනොච්චි | 870 | 5220 | 622 |
| **එකතුව** | | **12477** | **74862** | **8517** |




ඡායාරූපය: ආධාර වශයෙන් ලැබී ඇති මත්ස්‍යදැල්

**ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහාය යටතේ දේශගුණයට ඔරොත්තු දෙන බෝට්ටු (Climate resilient boats) සැපයීම**

තිරසාර සංවර්ධනය සහ දේශගුණික විපර්යාස අභියෝගවලට මුහුණ දීම සඳහා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් පර්යේෂණ මට්ටමින් නිර්මාණය කරන ලද අයහපත් දේශගුණ තත්ත්වයන්ට ඔරොත්තු දෙන ධීවර යාත්‍රා දෙකක් ධීවර අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී.

SL20 සහ SL23 යන අංකයන්ගෙන් හඳුන්වන මෙම ධීවර යාත්‍රා දිගින් මීටර් 6.3 සහ 7 ක් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කටයුතු සඳහා නිර්මාණය කර ඇත. FAO/ILO/IMO ප්‍රමිතීන්ට අනුකූලව, මෙම බෝට්ටු ධීවරයින්ගේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය ලබා දෙන අතර, තීව්‍ර කුණාටු සහ සුළි සුළං ඇතුළු දේශගුණික විපර්යාස මගින් එල්ල වන අභියෝගවලට ඔරොත්තු දෙන ලෙස සහ පෙරලීමට ඔරොත්තු දෙන ලෙස ඉදිකර ඇත. මෙම බෝට්ටු වල සැලසුම් FAO ධීවර යාත්‍රා සැලසුම් දත්ත ගබඩාව හරහා නොමිලේ ලබා ගත හැකිය.

බෝට්ටු වල ක්‍රියාකාරිත්වය සලකා බැලීමේදී, SL20 සහ SL23 ජලය මත ඇති පාදම (footprint) සම්ප්‍රදායික ධීවර බෝට්ටුවලට වඩා පුළුල් ය.පුළුල් පාදමක තිබීමේ එක් වාසියක් නම්, SL20 සහ SL23 බෝට්ටු තුළ වැඩිබර ප්‍රමාණයක් පැටවිය හැකි වීම හා, කාර්ය මණ්ඩලය සමග එම බර දරා ගැනීමේ හැකියාවත්, එමගින් බෝට්ටුවේ වේගය පවත්වා ගැනීමට බාධාවක් ඇති නොවීමත්ය. නව යාත්‍රා වල පතුලේ හැඩය "U" ආකාරයට නිර්මාණය කර ඇත. එමගින් ජලය මත යාත්‍රාවේ ස්ථිරතාව වඩා ඉහළ මට්ටමක පවතී. සාම්ප්‍රදායික ධීවර බෝට්ටු වල සාපේක්ෂ පැතලි පතුලක් ඇති අතර එමගින් ඉහළ රළ සහිත මුහුදු තත්වයන් තුළ ස්ථාවරත්වය අඩු අතරකාර්යක්ෂමතාව ද අඩු වේ.

මෙම බෝට්ටු සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ කටයුතු සඳහා දළ වශයෙන් වැය වූ රුපියල් මිලියන 9කමුදල වෙන් වූයේ නෝර්වීජියානු රජය මගින් FAOහි "තිරසාර සංවර්ධනය සඳහා ධීවර හා ජලජීවී සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කිරීම" සම්බන්ධ ව්‍යාපෘති සඳහා වූ මූල්‍ය භාර අරමුදලට ත්‍යාගශීලීව බැර කරන ලද මූල්‍ය අරමුදල් මගිනි.

පර්යේෂණ මට්ටමින් භාවිතා කිරීම සඳහා සහ මෙම වැඩිදියුණු කළ බෝට්ටු දෙක යාපනය සහ කළුතර දිස්ත්‍රික්කවල ධීවර කාර්යාල වෙත භාරදී ඇත. ඒවායේ භාවිතයට අදාළ දත්ත ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට (FAO) ඉදිරිපත් කළ යුතුය.

**ආර්ථික අර්බුදය හේතුකොට ගෙන ධීවර කර්මාන්තයට ඇතිවී ඇති බලපෑම අවම කර ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන - 2024**

මෙම වැඩසටහන යටතේ ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතා කරන එක්දින (IDAY) හා බහුදින (IMUL) ධීවර යාත්‍රා 6,500ක් පමණද, ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතා කරන කුඩා යාත්‍රා (OFRP, MTRB)32,000ක් පමණ ප්‍රමාණයක් සඳහා "ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව"ලබා දෙනු ලබයි.

ඉන්ධන වශයෙන් භූමිතෙල් භාවිතාකරන ධීවරයින් සඳහා දිනකට භූමිතෙල් ලීටර 15ක් හා මසකටදින 25ක උපරිමයකටයටත්ව රැකියාවේ නිරත වන දින සඳහා පමණක්ලීටරයකටරු 25/- ක"ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාවක්"ලබා දෙන අතරධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැලෙන MTRB හා OFRP ධීවර යාත්‍රා හිමිකරුවන් විසින් මිලදී ගන්නා භූමිතෙල් සඳහා දිනකට ලීටර් 15ක උපරිමයකට යටත්ව ධීවර කර්මාන්තයේ යෙදෙනදින 25 ක් සඳහා මසකට රුපියල් 9375 ක මුදලක් ප්‍රති පූර්ණය කරනු ලබයි.

ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතාකරන ධීවර යාත්‍රා හිමියන් සඳහා ඔවුන් විසින් මිලදී ගන්නා එක් ඩීසල් ලීටරයකට රු. 25/- ක මුදලක් ලැබෙන සේ එම ධීවරයින් සඳහාද "ධීවර කර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාවක්" අදාළ ධීවර යාත්‍රා වර්ගය, මෙහෙයුම් වර්ගය, මෙහෙයුම් ප්‍රදේශය හා මෙහෙයුම් කරන දින ගණන පදනම්ව ලබා දීමට රජය විසින් තීරණය කරන ලද අතර, ඒ අනුව ඉන්ධන වශයෙන් ඩීසල් භාවිතා කරන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, සක්‍රියව ධීවර කර්මාන්තයේ නියැලෙන IMUL හා IDAY ධීවර යාත්‍රා සඳහා මිළදී ගන්නා ඩීසල් ලීටරයකට රු.25 බැගින් මුදලක් මුදලක් ප්‍රති පූර්ණය කරනු ලබයි. එසේ වුවද එක් ගමන් වාරයක් සඳහා ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කරනු ලබන ඉන්ධන ප්‍රමාණය එම යාත්‍රාවේ ඉන්ධන ටැංකි ධාරිතාවය ඉක්මවා නොයා යුතු අතර එක් මාසයක් සඳහා රු 300,000/-. උපරිමයකට යටත්ව මුදල් ප්‍රති පූර්ණය කරනු ලබයි.

මෙම වැඩසටහන මාස 06ක කාලයක් සඳහා පමණක් ක්‍රියාත්මක වේ. එම කාළය තුල ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඩීසල් හා භූමිතෙල් මිල සංශෝධනයක් සිදුකරන සෑම අවස්ථාවකදීම එම සංශෝධන ක්‍රියාත්මක වන දින සිට මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභයද සංශෝධනය වේ. ඒ අනුව සෑමවිටම ඩීසල් සඳහා 7.5% ක ප්‍රතිශතයක් ද භූමිතෙල් සඳහා 12.5% ලෙසද සළකා ලීටරයක් සඳහා ලබාදෙන ප්‍රතිලාභය ගණනය කරනු ලබයි.

අදාළ"ධීවරකර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව" ලබා දෙනු ලබන්නේ 1980 ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ නියෝග මාලාවට අනුකූලව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහ 2024 වර්ෂය සඳහා මෙයෙහුම් බලපත්‍රය ලබා ගෙන ඇති ධීවර යාත්‍රා සඳහා පමණි.

ප්‍රතිලාභීන් සඳහා අදාළ දීමනාව ලබා දීමේදී ඔවුන් විසින් මිලදී ගන්නා ලද ඉන්ධන ප්‍රමාණයට අදාළ රිසිට් පත් අදාළ ධීවර දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලය වෙත මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ අයදුම්පත සමඟ ඉදිරිපත් කළ පසු අදාළ ගෙවීම ප්‍රතිලාභියාගේ බැංකු ගිණුමට ප්‍රධාන කාර්යාලය විසින් බැර කරනු ලබයි.

"ධීවරකර්මාන්තය යථාතත්වයට පත්කිරීමේ දීමනාව"ලබා දීමේ ප්‍රගතිය 2024.10.01. සිට 2024.12.31 දක්වා

| අනු අංකය | දිස්ත්‍රිකය | දීමනාව ලබා දුන් බෝට්ටු සංඛ්‍යාව | ගෙවූ මුළු මුදල (රු.) |
|---|---|---|---|
| 1 | මඩකලපුව | 256 | 1,796,300.00 |
| 2 | කොළඹ | 185 | 693,050.00 |
| 3 | හලාවත | 343 | 37,419,460.00 |
| 4 | ගාල්ල | 93 | 4,839,075.00 |
| 5 | යාපනය | 726 | 3,954,437.75 |
| 6 | කිලිනොච්චිය | 108 | 645,375.00 |
| 7 | කළුතර | 232 | 8,604,388.00 |
| 8 | කල්මුණේ | 36 | 1,012,875.00 |
| 9 | මන්නාරම | 72 | 337,500.00 |
| 10 | මාතර | 553 | 24,113,000.00 |
| 11 | තංගල්ල | 374 | 15,370,383.76 |
| 12 | ත්‍රිකුණාමලය | 635 | 4,082,326.00 |
| 13 | පුත්තලම | 179 | 3,646,250.00 |
| 14 | මීගමුව | 141 | 7,867,197.50 |
| 15 | මුලතිව් | 0 | - |
| | එකතුව | 3933 | 114,381,618.01 |

## 2.2. අභියෝග

- තොරතුරු තාක්ෂණ අංශය

1. තොරතුරු තාක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අදාළ නීති රීති හා රෙගුලාසි යාවත්කාලීන වී නොතිබීම.
2. ඇතැම් නිලධාරීන්ගේ නව තාක්ෂණය භාවිතයට ඇති පසුගාමීත්වය.
3. VMS උපකරණවල සේවා ගාස්තු ගෙවීමේදී ප්‍රතිපාදන හිගකම
4. පද්ධතීන් සම්බන්ධව පුහුණුව ලද නිලධාරීන් දේශීය හා විදේශීය නිවාඩු ලබාගෙන ඇති බැවින් නිලධාරීන් හිගකම.

- සංවර්ධන අංශය

1. තොටුපල ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් හඳුනා ගැනීම, අයිතිය තහවුරු කර ගැනීම හා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේදී පැන නගින ගැටළු
2. නිරන්තරයෙන් ස්වාභාවික විපත් හා කාලගුණික විපර්යාස නිසා වෙරළාසන්න පරිසර පද්ධතියට සිදුවන බලපෑම්
3. ධීවරයින් රක්ෂණය කිරීම අප විසින් ප්‍රවර්ධනය කල ච ඇතැම් ධීවරයින් ජීවිත රක්ෂණාවරණ ලබා ගැනීමට මැලිකමක් දැක්වීම.

- කළමනාකරණ අංශය

1. ඉහළ වානිජ වටිනාකමක් ඇති මුහුදු ජීවීන් අපනයනය සඳහා වැඩි ඉල්ලුමක් පැවතියද මෙම ඉල්ලුම සරිලන ලෙස සැපයිමක් සිදු කළ නොහැක. මෙම සම්පත් ක්ෂයවීමත් සම්පත් නෙළා ගැනීම කළමනකරණය සඳහා දැනට ශ්‍රී ලංකාව අවට මුහුදේ පවතික මෙම ජීවීන්ගේ තොග පිළිබඳ අධ්‍යනයක් සිදු කර නොමැති විමත් ගැටලුවක් ව ඇත.

2. ධීවර යෙදවුම් කළමනකරණය කිරීමේදි බහුදින යාත්‍රා නියාමනයක් සිදු කලද අඩු ආදායම්ලාභි ධීවරයන් භාවිතා කරන කරන කුඩා යාත්‍රා නියමනය ඔවුන්ගේ ජීවනෝපාය කෙරෙහි බලපාන බැවින් වෙරළාසන්න ධීවර කර්මාන්තයේ කුඩා යාත්‍රා ඉහළ යෙදවුමක් පැවතියද ඒම යාත්‍රා සීමා කිරිම ගැටලුවක්ව ඇත.

3. ධීවර සම්පත් කළමනාකරණය සඳහා රෙගුලාසි සකස් කිරිම සඳහා විද්‍යාත්මක පර්යේෂණ වාර්තා සහ නිර්දේශ අනිවාර්යය වන නමුත් වාර්ෂිකව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය වෙත මේ සඳහා වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් අවශ්‍ය ප්‍රමාණයට මෙම අධ්‍යනයන් සිදු නොවිමත් හේතුවෙන් නිසිකලට අවශ්‍ය රෙගුලාසි සකස් කිරිම හා සංශෝධනය සිදු කල නොහැකි වී ඇත.

- මෙහෙයුම් අංශය

1. ශ්‍රී ලංකාවෙන් මසුන් මිලදී ගන්නා, විදේශ රාජ්‍යයන් විසින් පරීක්ෂා කරනු ලබන මෙම අංශය විසින් ධීවර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබන යාත්‍රා ලැයිස්තු වල බලපත්‍ර වලංගු කාලය දිනපතා යාවත්කාලීන කිරීමේදී සමහර යාත්‍රා තොරතුරු නිසි පරිදි යාවත්කාලීන කිරීමට තරම් නිවැරදි තොරතුරු දිස්ත්‍රික් කාර්යාල මගින් ලබා ගැනීමට ඇති අපහසුතාවය.

2. බහුදින යාත්‍රාවල නියමුවන් විසින් මුහුදේ දී මසුන් අල්ලන සෑම අවස්ථාවකදීම සම්පූර්ණ කරනු ලබන ධීවර දත්ත තොරතුරු ලොග් සටහන් පොත මුහුදේ දී යාවත්කාලීන කිරීමේදී අදාල ධීවර කාර්මික මහතා විසින් ඔහුගේ අත්දැකීම අනුව ඔහු විසින් අල්ලා ගන්නා ලද මසුන්ගේ බර තීරණය කර එම ලොග් දත්ත සටහන් පොතෙහි ලිවීම ධීවර දෙපාර්තමේන්තුවෙහි මත්ස්‍ය නිෂ්පාදන දත්තවල නිවැරදිතාවයට අභියෝගයකි.
3. මත්ස්‍ය ඇල්ලුම් සහතික (Catch Certificate) නිකුත් කිරීම සඳහා ධීවර මෙහෙයුම් අංශය මගින් නිකුත් කරනු ලබන සත්‍යාපන වාර්තාව (Catch Verification report) නිකුත් කිරීම සඳහා වරාය නිලධාරීන් සහ කොළඹ මෙහෙයුම් අංශයේ සත්‍යාපන ඒකකයේ නිලධාරීන් විසින් මසුන් ගොඩබාන අවස්ථාවේදී මසුන්ගේ බර කිරීමක් සිදු නොකර අදාල යාත්‍රාවේ නියමුවා විසින් සඳහන් කරන ලද බර පදනම් කරගෙන මත්ස්‍ය ඇල්ලුම් වාර්තා නිකුත් කිරීම හා යාත්‍රාවේ රැගෙන ආ මසුන් ප්‍රමාණයේ නිවැරදි භාවය තහවුරු කිරීම පිළිබඳව අභියෝගයක් පවතී.
4. VMS නියෝග මාලාවේ ප්‍රකාරව මුහුදේ දී තම යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය අක්‍රීය තත්ත්වයට පත්වී ඇති බවට යාත්‍රාවේ නියමුවා දැනුවත් වූ පසු ඔහු විසින් එහි 9 වන නියෝගය ප්‍රකාරව මසුන් අල්ලමින් සිටින අතරතුර සෑම පැය හතරකට වරක් තම ගුවන් විදුලි යන්ත්‍රය හරහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ගොඩබිම පිහිටි ගුවන් විදුලි මධ්‍යස්ථානයක් වෙතට තම යාත්‍රාවේ පිහිටීම සහ වෙලාව ලබාදීම සිදුකළ යුතුය.
5. එසේ ලබාදීම සිදුකළ නොහැකි නම් එම යාත්‍රාව කඩිනමින් ආපසු හරවා ගොඩබිමට පැමිණිය යුතුය. මෙසේ පැය හතරකට වරක් HF සංඛ්‍යාත ඔස්සේ ගොඩබිම හා සම්බන්ධ වීම අභියෝගාත්මක කාරණාවක් වන අතර එම SSB HF තාක්ෂණය මගින් එසේ දවසේ සෑම අවස්ථාවකම ගොඩබිම හා සම්බන්ධ වීම ඉතා අසීරු කටයුත්තකි.

➢ <u>තත්ත්ව පාලන අංශය</u>

1. අපනයනය කිරීමට සුදුසු තත්වයේ දේශීය අමුද්‍රව්‍ය නොමැති වීම.
2. යුරෝපා සංගමයේ රටවල් වලට අපනයනය කරනු ලබන මත්ස්‍ය තොග යුරෝපා සංගමයේ අනුමත පරාමිතීන්ට අනුකූලව පරික්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් පර්යේෂණාගාර වල නොමැති වීම.

➢ <u>විමර්ශන හා පුහුණු අංශය</u>

1. ධීවර ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා ඔවුන්ගේ රැකියාවේ ස්වභාවය හේතුවෙන් එම ප්‍රජාව සම්බන්ධ කර ගැනීමට පවතින අපහසුතා.
2. දිස්ත්‍රික්ම ට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා යොමු වීමේ දී ප්‍රවාහනය සඳහා වන ඉන්ධන වියදම් අධික වීම හේතුවෙන් ප්‍රමාණවත් පරිදි දිස්ත්‍රික්ක මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්වීමට නොහැකි වීම.

## 2.3. ඉදිරි ඉලක්ක

➢ තොරතුරු තාක්ෂණ අංශය

1. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පරිපාලන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම.
2. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ මූලික පරිගණක දැනුම යාවත්කාලීන කිරීම.
3. MSDFAR පද්ධතිය භාවිතා කිරීම සම්බන්ධව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක කටයුතු වැඩසටනක් ක්‍රියාත්මක කිරීම.
4. VMS පද්ධතියේ ප්‍රචාරක කටයුතු සඳහා වැඩසටනක් දියත් කිරීම.
5. යාත්‍රා පැමිණීම සටහන්කිරීම සඳහා MSDFAR පද්ධතිය සංවර්ධනය.
6. විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා MSDFAR පද්ධතිය සංවර්ධනය.

➢ සංවර්ධන අංශය

1. ස්වභාවික විපත් හෝ වෙරළාසන්න ධීවර කර්මාන්තයට සිදුවන බාධා හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදුවන බලපෑම් අවම කිරීම (යටිතල පහසුකම් සංවර්ධනය)

2. සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මකභාවයෙන් ඉහළ කරවල නිෂ්පාදනය සඳහා වියළීමේ උපකරණ හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

3. චීන සමූහාණ්ඩු අධාර යටතේ ශ්‍රී ලංකා රජයට පරිත්‍යාග කරන ලද පෙර සවි නිවාස 500 උතුරු නැගෙනහිර පළාත්වල සක්‍රීය ධීවර කර්මාන්තයේ නියැලෙන අඩුආදායම්ලාභී ධීවර කාර්මිකයිව් වෙත බෙදා දීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් ප්‍රතිලාභීන්ගේ ඉඩම්වල මෙම නිවාස ඉදිකර දීම.

4. කලපු කළමනාකරණය හා සංවර්ධනය සඳහා කලපු සීමා සලකුණු කිරීම, කලපු කළමනාකරණ ප්‍රදේශ ගැසට් කිරීම, කමිටු පිහිටුවීම හා සැලසුම් සකස් කිරීම.

5. තොටුපල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
උදා - බීකන් පහන් ස්ථාපිත කිරීම

➢ කළමනාකරණ අංශය

1. යාත්‍රා ලේඛනය යාවත්කාලීන කිරීම
2. බලපත්‍ර ලබා දීම ඩිජිටල්කරණය කිරීම
3. යාත්‍රා ධීවර යෙදවුම් නියාමනය සඳහා අවශ්‍ය රෙගුලාසි සකස් කිරීම.

➢ මෙහෙයුම් අංශය

1. සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් බහුදින ධීවරයාත්‍රා සඳහා මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ MSDFAR පද්ධතිය ඔස්සේ නිකුත් කොට එම තොරතුරු දෛනිකව ධීවර මෙහෙයුම් අංශයට බාගත කර හැකි ලෙසට පද්ධතිය සකසා ගැනීම සිදුකළ යුතුය.

2. සෑම මසුන් ගොඩබානු ලබන වරායක් තුළ සෑම බහුදින යාත්‍රා ගමන් වාරයකම ගොඩ බානු ලබන මසුන් ප්‍රමාණය යාත්‍රා පරීක්ෂක නිලධාරියකු විසින් පරීක්ෂා කොට අදාළ මසුන්ගේ බර දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන තරාදි මගින් කිරා එම බර එම යාත්‍රාවේ නියමුවා විසින් සඳහන් කරනු ලැබූ බර සමග සංසන්දනය කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කළ යුතුය.

3. මත්ස්‍ය ඇල්ලුම් සහතික නිකුත් කිරීම පිණිස ධීවර දෙපාර්තමේන්තුවේ යාත්‍රා පරීක්ෂණ නිලධාරියකු විසින් අදාල යාත්‍රාවේ මසුන්ගේ බර කිරා නිකුත් කරනු ලැබූ සහතිකයක් මත පදනම්ව පමණක් සිදුකිරීම ආරම්භ කළ යුතුය.

4. අපගේ බහු දින යාත්‍රා විසින් දැනට භාවිතා කරනු ලබන HF Radio තාක්ෂණය වෙනුවට ලෝකයේ මේ වන විට නාවිකයන් විසින් භාවිතා කරනු ලබන චන්ද්‍රිකා තාක්ෂණය භාවිතයෙන් සිදුකරනු ලබන සන්නිවේදන මාධ්‍යයක් කෙරෙහි අවධානය යොමු විය යුතුය. මසුන් අපනයනය කරනු ලබන අරමුණින් ධීවර කටයුතු සඳහා පිටත් වන සියලු යාත්‍රා සඳහා මෙම නවතාක්ෂණික ක්‍රමවේද ඇතුලත් පණිවිඩ හුවමාරු උපකරණ තිබීම අනිවාර්ය කිරීමට සිදුවනු ඇත.

➢ <u>තත්ත්ව පාලන අංශය</u>

1. යුරෝපා කොමිසම විසින් නියම කරන ලද මාර්ගගත ක්‍රමයට මසුන් අල්ලා ගැනීමේ සහතික නිකුත් කිරීමේ වැඩ සටහන 2026 වර්ෂයේ ආරම්භ කිරීම.

➢ <u>විමර්ශණ හා පුහුණු අංශය</u>

1. ධීවර කටයුතු වලට අදාළ නීති විරෝධී මෙහෙයුම් අවම කිරීම
2. වාර්ෂික වැටලීම් ඉලක්ක ප්‍රශස්ත මට්ටමින් සම්පූර්ණ කිරීම
3. වාර්ෂික පුහුණු සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ධීවර ප්‍රජාව සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක බවින් යුතුව පුහුණු වැඩසටහන් දියත් කිරීම.

# 03. පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | | - | ඒසීඒ-1 |
| 164,812,500 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 173,842,450 | 179,170,315 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | | - | |
| **164,812,500** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **173,842,450** | **179,170,315** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 660,489,423 | 400,637,299 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 264,313,407 | 225,239,292 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 29,753,255 | 32,454,828 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| **-** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **954,556,085** | **658,331,418** | |
| **-** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,128,398,535** | **837,501,733** | |
| **-** | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | **-** | **-** | |
| **-** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,128,398,535** | **837,501,733** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 646,588,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 624,233,273 | 541,509,993 | ඒසීඒ-2(ii) |
| 179,900,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 161,744,364 | 334,802,171 | ඒසීඒ-2(ii) |
| 831,400,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 104,059,986 | 21,230,218 | ඒසීඒ-2(ii) |
| | පොළී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 43,269 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 1,057,034 | |
| **1,657,988,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **890,080,892** | **898,599,417** | |
| | **මූලධන වියදම්** | | | | |
| 23,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 18,496,442 | 27,063,949 | **ඒසීඒ-2(ii)** |
| 36,087,632 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 7,601,733 | 649,101,479 | |
| 5,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 3,176,392 | 912,900 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 2,000,000 | හැකියා වර්ධනය | **14** | 1,854,471 | 2,089,586 | |
| 40,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 11,263,960 | 20,429,193 | |
| **106,087,632** | **මුළු මූලධන වියදම් (උ)** | | **42,392,998** | **699,597,107** | |
| | තැන්පතු ගෙවීම් | | 173,107,132 | 97,128,641 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 33,325,953 | 26,495,786 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **206,433,085** | **123,624,428** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **1,138,906,975** | **1,721,820,951** | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(10,508,440)** | **(884,319,218)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | - | - | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |
| | | | - | - | |

**3.2** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

## 2024 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | | තතය | |
|---|---|---|---|
| | සටහන | **2024** රු. | **2023** රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,217,108,554 | 2,160,107,046 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 67,573,654 | 64,000,956 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **2,284,682,208** | **2,224,108,002** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (255,487,108) | (167,262,494) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,217,108,554 | 2,160,107,046 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | 591,037 | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 322,469,725 | 231,263,450 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **2,284,682,208** | **2,224,108,002** |

පිටු අංක 07 සිට 36 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 37 සිට 49 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදු කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාතර්‍ාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ...................... | ...................... | ...................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය :2025/02/25 | දිනය :2025/02/ 25 | දිනය :2025/02/25 |
| එම්.ඒ.එල්.එස්.එන්.කේ. මන්ත්‍රීනායක<br>ලේකම්<br>ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය<br>02 වන මහල, නව මහලේකම් කාර්යාලය,<br>මාලිගාවත්ත, කොළඹ 10 | සුසන්ත කහවත්ත<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ඒ.ජී.එම්. දිල්හානි<br>ප්‍රධාන ගණකාධිකාරි<br>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,<br>මාලිගාවත්ත, කොළඹ 10. |

02

**3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

**ඒසීඒ-සී**

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තත්‍ය | |
|---|---|---|
| | **2024** රු. | **2023** රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 173,126,050 | 179,348,915 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 40,876,634 | 32,640,661 |
| අග්‍රිම ලැබීම් | 841,595,400 | 477,521,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 24,925,557 | 23,659,038 |
| තැන්පතු ලැබීම් | 264,313,408 | 225,239,292 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,344,837,049** | **938,408,905** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 772,892,584 | 665,519,090 |
| සහනාධාර සහ මාරුකිරීම් | 102,484,183 | 21,230,218 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 53,582,430 | 6,531,334 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 181,105,977 | 76,883,701 |
| අත්තිකාරම් ගෙවීම් | 25,246,697 | 19,999,828 |
| තැන්පතු ගෙවීම් | 173,107,132 | 97,128,641 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,308,419,003** | **887,292,813** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **36,418,046** | **51,116,092** |

| | | |
|---|---|---|
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | 36,418,046 | 51,116,092 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **36,418,046** | **51,116,092** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(36,418,046)** | **(51,116,092)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **-** | **-** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

**3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්**

**වාර්තා කිරීමේ පදනම**

**1) වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2) මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) මුදල් හා මුදල් සමාන දෑ**

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය**

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසන් ආදායම් ඇස්තමේන්තුවේ %ක් ලෙස |
| 10.03.07.06 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ බලපත්‍ර ගාස්තු | 183,354,500 | 164,812,500 | 173,842,450 | 105 |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරන ලද ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 800,000,000 | 1,657,988,000 | 890,080,892 | **53.68** |
| ප්‍රාග්ධන | 100,000,000 | 106,087,632 | 42,392,998 | **39.96** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරනු ලබන ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල %ක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 151-1-2-1-1501 | ධීවර අමාත්‍යාංශය | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ධීවර ක්ෂේත්‍රයට සිදුවූ හානි තක්සේරු කිරීම,ජීවිකාව අහිමි වූ පුද්ගලයින් හඳුනා ගැනීම හා වන්දි ගෙවීම ඇතුළු පරිපාලනමය කාර්යයන් සිදු කිරීම | 51,647,075 | 51,647,075 | 49,146,762 | 95 |
| 151-2-3-64-2104 | ධීවර අමාත්‍යාංශය | හලාවත කලපුවේ ඇති නිශ්පාදිත මායිම් කණු 2276ක් පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කිරීම | 2,592,725 | 2,592,725 | 2,149,108 | 82 |
| 151-2-3-82-2509 | ධීවර අමාත්‍යාංශය | චීන සමූහාණ්ඩුව මඟින් ධීවර කාර්මිකයන් වෙත ලබා දෙන සහල් සහනාධාර බෙදාහැරීමේ වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදීම | 6,293,000 | 6,293,000 | 1,465,589 | 23 |
| 253-1-2-4-1502-12 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | අත්තිකාරම් බී. ගිණුමට අදාළව ණය ශේෂ පියවීම | 889,351 | 889,351 | 820,971 | 92 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2024.12.31 දිනට මූල්‍ය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.) | 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.) | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය %ක් ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| **9151** | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 585,258,490.38 | 585,258,490.38 | - | - |
| **9152** | යන්ත්‍රෝපකරණ | 1,217,863,620.65 | 1,217,863,620.65 | - | - |
| **9153** | ඉඩම් | 392,066,000.00 | 392,066,000.00 | - | - |
| **9154** | අස්පෘශ්‍ය වත්කම් | 21,920,443.02 | 21,920,443.02 | - | - |
| **9155** | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| **9160** | කෙරී ගෙන යන වැඩ | - | - | - | - |
| **9180** | බදු දෙන වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින්නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළයුතු ය.

අවසාන විගණන වාර්තාව මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව අවසානයේ දක්වා ඇත.

## 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 89% - 75% | 74% - 50% |
| 1. ස්වාභාවික අනතුරු සඳහා වන්දි ලබා දීම | | | 71% |
| 2. කලපු සීමා නිර්ණය කිරීම | | | 50% |
| 3. 2021 මැයි මස 21වන දින සිදු වූ New X Press Pearl භාණ්ඩ නෞකාව ගිනි ගැනීමේ සිද්ධිය හේතු වෙන් ධීවර ක්ෂේත්‍රයට සිදු වූ බලපෑම නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ප්‍රගතිය | 97% | | |
| 4. යාත්‍රා නිරීක්ෂණ අංශයේ හා ඊට සම්බන්ධිත අනෙකුත් අංශවල නිලධාරීන් පුහුණු කිරීම | 100% | | |
| 5. පෙ.ව.7.00, ප.ව.2.00 සහ ප.ව.10.00ට පහත සඳහන් තොරතුරු යටතේ වාර්තා ලබා ගැනීම | 100% | | |
| I. කිලෝ මීටර් 48ක් ඇතුළත වරාය සීමාවට ළඟාවන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | 100% | | |
| II. දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | 100% | | |
| III. යාත්‍රාවල VMS විසන්ධි කිරීම් පිළිබඳ වාර්තා ලබා ගැනීම | 100% | | |
| IV. බැටරිය විසන්ධි වූ යාත්‍රාවල ඇතුළත බැටරියේ විසන්ධි වීම පිළිබඳ වාර්තා ලබා ගැනීම | 100% | | |
| V. කාල පරාසයක් තුළ ක්‍රියා විරහිතව ඇති යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම | 100% | | |
| 6. ආපදාවටලක් වූයාත්‍රාහඳුනා ගැනීම සහ තොරතුරු සෝදිසි මෙහෙයුම් අංශය වෙත ලබා දීම | 90% | | |
| 7. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු ගෙන්වා ගැනීම හා කළමනාකරණය | 100% | | |
| 8. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන යාත්‍රාවල තොරතුරු සත්‍යාපනය කිරීම | 90% | | |
| 9. ලොග් වාර්තා දත්ත ගබඩාවට ඇතුළත් කිරීම හා කළමනාකරණය | 100% | | |
| 10. තොරතුරු විමර්ශනය කිරීම හා නීති මගින් කටයුතු කිරීම | 90% | | |
| 11. ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබා දීම | 90% | | |
| 12. ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබා දීමට කටයුතු කිරීම | 100% | | |
| 13. ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කර දීම | 90% | | |
| 14. විදේශීය රටවල දී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම | 100% | | |
| 15. අන්තර්ජාතික මුහුදු සීමාවන්හී පාවියමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම | 90% | | |

| | | | |
|---|---|---|---|
| 16. කුඩා හා එක්දින යාත්‍රා සඳහා සන්නිවේදන පහසුකම් ලබා දීම හා ධීවර ප්‍රජාව දැනුවත් කිරීම | | | **50%** |
| 17. දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම | **100%** | | |
| 18. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම | **90%** | | |
| 19. අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාළ ආයතන දැනුවත් කිරීම | **90%** | | |
| 20. අනතුරුවලට පත්වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා බේරා ගැනීම් සිදු කිරීම | **90%** | | |
| 21. ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOTC), ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO), යුරෝපා සංගමය (EU) වැනි ජාත්‍යන්තර ආයතන සඳහා කාලීන වාර්තා සැපයීම සහ වාර්ෂික රැස්වීම් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම | **100%** | | |
| 22. දෙපාර්තමේන්තුවේකාර්යය මණ්ඩලය පුහුණු කිරීම - තොරතුරු තාක්ෂණ පදනම | **100%** | | |
| 23. සර්වර් පද්ධතියේ ආරක්ෂාව පිළිබඳ ක්‍රියා කිරීම | **100%** | | |
| 24. ධීවරයින් සඳහා ඊ-ලොග් යෙදුම ක්‍රියාත්මක කිරීම | **100%** | | |
| 25. දෙපාර්තමේන්තුවේ දත්ත විශ්ලේෂණය සඳහා “R” සංඛ්‍යාලේඛන භාෂාව හඳුන්වා දීම | **100%** | | |
| 26. OFRP,MTRB සහ NTRB යාත්‍රා පද්ධතිය හරහා ලියාපදිංචිය ආරම්භ කිරීම | | | **20%** |
| 27. Doxproපද්ධතියේ භාවිතය පුළුල් කිරීම | **100%** | | |
| 28. BLUE TRACKER පද්ධතියට නිලධාරීන් පුහුණු කරවීම | **100%** | | |
| 29. Alert Management පද්ධතියක් හඳුන්වා දීම | **100%** | | |
| 30. කලාපීය Fishing MonitoringCenter නමින් එකමුතුවක් ආරම්භ කිරීම | | | **70%** |
| 31. යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය පවත්වා ගැනීම | **100%** | | |
| 32. පරීක්ෂණ හා අධීක්ෂණ. | | | |
| • අපනයන මත්ස්‍ය පිරිසැකසුම් ආයතන පරීක්ෂණ සංඛ්‍යාව | | | **66%** |
| • නිල සාම්පල ලබා ගැනීම - ආයතන | | | **27%** |
| • ඉස්සන් වගා ගොවිපල පරීක්ෂාව | | | **47%** |
| • ප්‍රතිඅපනයනය සඳහා ආනයනය කරනු ලබන මත්ස්‍ය තොග පිළිබඳව පරීක්ෂණ සිදු කිරීම | | | **-** |
| 33. **අනුමත කිරීම් සහ සහතික කිරීම්** | | | |
| • නව මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන අනුමත කිරීම හා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචිය යාවත්කාලීන කිරීම | **100%** | | |
| • අපනයනය සඳහා ස්වස්ථතා සහතික නිකුත් කිරීම | **93%** | | |
| • මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම | **99%** | | |
| 34. **ජලජීවී වගා අවශේෂ අධීක්ෂණ ජාතික වැඩසටහන** | | | |
| • ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන පරීක්ෂාව | | | |
| • ජලජීවී වගා ගොවිපලක්ෂේත්‍ර පරීක්ෂාව | | | **37.5%** |
